# 3 විහඟ ආදරය

පී. බී. අල්විස් පෙරේරා කොළඹ යුගයේ දෙවන කවි පරපුරට අයත් දක්ෂ කවියෙකි. සොබාදහම, ඉරුණු කොඩිය, උක්දඬුදුන්න, රන්තලිය ඔහුගේ පද්‍ය සංග්‍රහ කිහිපයකි. ඔහු ළමා පද්‍ය රචනා පිළිබඳ ව ද ප්‍රසිද්ධියක් දැරූ කවියෙකි. ''විහඟ ආදරය'' එතුමාගේ නිර්මාණයකි.



01. පොඩි තුඩු දොඩම් කටු මෙනි හී විදිල්ලෙකි
නෙත් අබ වගෙයි පා පොල් කෙඳි තොටිල්ලකි
පෙඳ වට පියාපත් දේදුනු වළල්ලකි
හේ පැණි කුරුල්ලෙකි ඕ පැණි කිරිල්ලකි

02. දුව පැන ඇවිද ඉගිළී ගම මුළුල්ලෙහි
යන්තම් පැපොල් පළුවක් වැනි කැඳුල්ලෙහි
රෑ ගත කරන නිතර ම එක තුරුල්ලෙහි
මොහු කලගෙවති පෙම් ලොව මිණි සඳැල්ලෙහි

03. කඳු මත ගැඹුරු මිටියාවත ළඳලු වැවී
මායා සිහින නිල් පාටින් සුවඳ කැවී
පිබිදෙන වසන්තය දැක ඕ උමතු නො වී
ගී ගැයුවා ය සිය සැමියා ළඟට වෙවී

04. දහවල් විඩා පත් වී නිල් පඳුරු පිට
සිය රසවතා සමගින් කල ගෙවන විට
ඕ තටු අතර නො තබා මල් කැකුළු හොට
සඟවන්නී ය සැමියා අත්තටුව යට

05. ගැබ් ගත් පසු ව ඈ හැඟුමෙන් යුතු ව එක
දෙදෙනා මාරුවට විඳිමින් ගැහැට නෙක
බිජුවට බිඳෙන තුරු එය උණුසුමට රැක
අරුණෝදයක දී දරුවා මුහුණ දැක

06. උෟ පෙඳ වැඩී නිදහස් රස විඳින තුරා
පණුවන් සොයා පියඹා වෙල්එළිය පුරා
සති කීපයක් මුළු දහවල වෙහෙස දරා
දාරක සෙනෙහෙ මතු වී සිය සැපත මරා

07. පොඩි සුරතලා වෙත දී හැකි සුවය සොයා
හැම උදයක ම හිරු රැස් දැක විරුද ගයා
වැජඹෙන සඳෙහි ජෝඩුව නැඟ තරුණ පියා
පැටවා ගෙයින් පිට වී ලෝකයට ගියා

8. මුදු පෙඳ නැඟී පැටවා ලොකු වී විසුව
නික්මී අලුත් ලෝකය වෙත ගිය පසුව
නැවතත් කුරුලු ජෝඩුව සුරතල් මුසුව
කල් ගත කළහ අරඹා පෙම් කසු කුසුව

## 3.1 අරුත් පැහැදිලි කිරීම.

පෙඳ - තටු
සඳැල්ලෙහි - සඳලුතලයෙහි; ගෙවල උඩුමහලෙහි සඳරැස් වැටීම සඳහා වහලක් නැති ව තැනූ තට්ටුවෙහි
උමතු - වියරු
දාරක - දරු
විරුද - ප්‍රශස්ති/ ප්‍රශංසා/ ස්තෝත්‍ර/ ස්තුති ගීතිකා

### 3.2 ක්‍රියාකාරකම 1

01. මේ කවි පෙළෙහි සෙනෙහස පිළිබඳ දැක්වෙන අවස්ථා මොනවා ද ?

02. මේ නිර්මාණයෙහි ඇතුළත් පවුල් ජීවිතයක තිබිය යුතු උසස් ගුණාංග කිහිපයක් ලියන්න.

03. මව මෙන් පියා ද දරුවන් රකින්නට වෙහෙසෙන අයුරු පැදි පෙළෙන් උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

04. පැණි කුරුල්ලන්ගේ තුඩ කුමකට උපමා කර තිබේ ද?

05 කවියා පවසන පරිදි මෙහි දැක්වෙන කූඩුව කුමක් වැනි ද?

**භාෂා හුරුව**

**01. මේ යෙදුම්වලින් ගම්‍ය වන අර්ථ පැහැදිලි කරන්න.**

i. "මොහු කලගෙවති පෙම් ලොව මිණි සැඳැල්ලෙහි"

ii. "පිබිදෙන වසන්තය දැක ඈ උමතු නො වී"

iii. "උං පෙඳ වැඩී නිදහස් රස විඳින තුරා"

iv. "දාරක සෙනෙහෙ මතු වී සිය සැපත මරා"

v. "හැම උදයක ම හිරු රැස් දැක විරුද ගයා"

02. "කසුකුසු" යනු **යුගල පදයකි.** තවත් එවැනි යුගල පද සොයා ලියන්න.

**03. පැදි පෙළෙන් තෝරා මේ පදවලට සමාන පද ලියන්න.**

i. කූඩුව

ii.. මල් පොහොට්ටු

iii. උදෑසන

iv. ප්‍රශස්ති

v. දරු

vi. හැම තැන ම

vii. ළපලු

viii. සරතැස

ix. දියත

x. වුවන

**වියරණ හුරුව**

පහත දැක්වෙන වාක්‍යවල හිස්තැන් පිරවීමට සුදුසු සර්වනාම පැදි පෙළෙන් තෝරන්න.

i. .................. පැණි කුරුල්ලෙකි.

ii. .................. පැණි කිරිල්ලකි.

iii. .................. කලගෙවති.

iv. .................. ගී ගැයුවා ය.

v. .................. කැකුළු හොට සගවන්නී ය.

vi. .................. දැඩි ආලයෙන් පසු වෙයි.

vii. .................. දරුවාගේ මුහුණ දැක්කා ය.

viii. .................. නිදහස් රස විඳියි.

**3.4 ක්‍රියාකාරකම් 2**

01. "සොබා දහමෙහි සුලබ අවස්ථාවක් වුව ද රසවත් නිර්මාණයක් බවට පත් කරන්නට දක්ෂ කවියකුට හැකි වේ." සාකච්ඡා කරන්න.

02. මේ කවි පෙළ, තනි තනි ව හෝ කණ්ඩායම් වශයෙන් හෝ ගායනා කරන්න.

03. කුරුලු මව සහ කුරුලු පියා අතර ඇති වන සංවාදයක් ලියන්න.

04. "කුරුලු ලොවේ අසිරිය" යන මැයෙන් කවි පන්තියක් නිර්මාණය කරන්න.

**සංකල්පනා**

මෝරන වී කරල
නැමෙයි රස වැඩි වන කල
නුවණ මෝරන කල
එමෙන් දරු කැල - නැමෙත් මනකල